www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂය ජනාධිපතිගේ ඒකාධිපති පියවරයන් හෙලා දකියි

## Socialist Equality Party condemns Sri Lankan president’s dictatorial actions

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2004 පෙබරවාරි 19 දින**

ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, පෙබරවාරි 7 දින, පාර්ලිමේන්තුව විසුරුවා හැර අගමැති රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) සභාග ආන්ඩුව බලයෙන් පහකිරීමට ගත් අත්තනෝමතික හා ප්‍රජාතන්ත්‍ර විරෝධී තීන්දුව, සමාජවාදී සමානතා පක්ෂය (සසප) දැඩි ලෙස හෙලා දකියි. ඇයගේ ක්‍රියාවන් පශ්චාත් නිදහස් ශ්‍රීලංකා ඉතිහාසයේ පෙර නො වූ විරූ ක්‍රියාවන් වන අතර ඒවා ව්‍යවස්ථාමය කුමන්ත්‍රනයකට සමාන වේ.

පාර්ලිමේන්තුව තුල බහුතරයක් සහිත වූ තෝරා පත් කර ගත් ආන්ඩුව, කිසිදු වග විභාගයකින් තොරව, බලයෙන් පහකිරීමෙන් ජනාධිපති රතු ඉර පැන ඇත. එතැනින් ආපසු හැරීමක් නැත.

අප්‍රේල් 2 දා මැතිවරනයේ ප්‍රතිඵලය කුමක් වුවත් රාජ්‍ය තන්ත්‍රයේ ප්‍රධාන ලීවරයන් සියතට ගනිමින් කුමාරතුංග දැන් සැබෑ බලය තමන් වෙත පවරාගෙන ඒකාධිපති පාලනයකට පදනම දමා ඇත.

ජනාධිපති ප්‍රධාන මුක්කු දෙකක් මත සෘජුවම පදනම්ව සිටියි. එනම් මිලිටරිය හා ඇගේ නව සගයා වන සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) මතයි. දැනට පසුබිමේ රැඳී සිටිය ද මිලිටරි ප්‍රධානීන්ට වඩ වඩාත් සෘජු හා විවෘත දේශපාලන ක්‍රියාවලියකට, නො වැලැක්විය හැකි ලෙස ම, කැඳවුම් කෙරෙනවා ඇත. ඒ සමගම දේශප්‍රේමයේ උමතුවෙන් වාත්තු කල ජවිපෙ කොටස් පාලන තන්ත්‍රයේ විරුද්ධවාදීන් වෙත, විශේෂයෙන් ම කම්කරු පන්තිය පැත්තෙන් එන විරෝධයකට, ප්‍රහාර එල්ල කිරීම සඳහා බලඇනියක් ලෙසින් යොදාගන්නවා ඇත.

පසුගිය මාස තුනේ සිද්ධීන් සියල්ලක් ම, නොවරදින ලෙස, යොමු වී ඇත්තේ මේ දිශාවට ය. නොවැම්බර් 4 වන දින මිලිටරි ප්‍රධානීන් හා ජවිපෙ විසින් දිරිගැන්වූ කුමාරතුංග ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු හා ජනමාධ්‍ය යන ප්‍රධාන අමාත්‍යංශ තුනේ පාලනය සියතට ගත් අතර පාර්ලිමේන්තුව කල්දමා ම්ලෙච්ඡ හදිසි නීතිවල පිහිට පැතීමට ද යොමුවූවා ය. මෙම අසාමාන්‍ය පියවරයන් ඇය යුක්ති සහගත කලේ දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග සාම සාකච්ඡා මගින්, අගමැති වික්‍රමසිංහ, “ජාතික ආරක්ෂාවට වලකපන” බවට ඔහුව හෙලා දකිමිනි.

මෙතැනදී, ව්‍යාපාරික ලොක්කන්ගේ හා මහාබලවතුන්ගේ බලපෑම් හමුවේ කුමාරතුංගට අඩිය පස්සට ගැනීමට බල කෙරුනි. හදිසි තත්වය නිලවසයෙන් ප්‍රකාශ නො කල අතර අයවැය සම්මත කර ගැනීම සඳහා කෙටි කලකට පාර්ලිමේන්තුව යලි කැඳවනු ලැබුනි. එහෙත් ආන්ඩුවේ ක්‍රියාකාරිත්වය පසුගිය මාස තුන පුරාම පැවතුනේ බොහෝ දුරට පක්ෂාඝාතව ය. වික්‍රමසිංහ හා කුමාරතුංග අතර දිග්ගැස්සුනු සාකච්ඡා, විසඳුමක සේයාවකුදු නො දැක, ඔහේ ඇදී ගියේ ය.

අමාත්‍යංශ සියතට ගැනීමෙන් කුමාරතුංග ලිහා හැරියේ වඩවඩාත් තමන්ගේ ම පාලනයට නතු නො වූ දේශපාලන බලවේගයන් ය. ඇයගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) තුල පාරාජිකාවකට පත්ව සිටි සැලකිය යුතු ස්ථරයක් පක්ෂයේ මහජන පදනම යලි වාත්තු කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙසින් ජවිපෙ සමග සන්ධානයක් ඉල්ලා සිටියේ ය.

ජනවාරි 20 දින අත්සන් තැබූ ජවිපෙ ශ්‍රීලනිප ගිවිසුම රට එල්ටීටීඊයට පාවා දෙන බවටත් ආර්ථිකයට වල කපන බවට හා දූෂනය පිලිබඳවත් එජාපෙ හෙලා දැක්කේ ය. නව සන්ධානය මැතිවරන කොමසාරිස් විසින් නිලවසයෙන් ලියාපදිංචි කිරීමෙන් දිනක් ගත වූ පෙබරවාරි 7 දා කුමාරතුංග සිය අලුත් හවුල්කරුගේ බලකිරීම් හමුවේ අවසන් වසයෙන් ආන්ඩුව නෙරපා හැරියා ය.

එතැන් පටන් වික්‍රමසිංහ හෝ ඔහුගේ ඇමතිවරුන් කිසිවෙකුත් නොවිමසා රාජකාරි කටයුතු, කුමාරතුංග විසින් වඩවඩාත් තමන් විසින් ම තීන්දු කෙරුනි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පැය කීපයකට පෙර ඇය සිය දේශපාලන සහචරයන් දෙදෙනෙකුට වැදගත් අමාත්‍යංශ දෙකක් පැවරුවා ය. දින කිහිපයකට පසුව ජනාධිපති කනිෂ්ඨ ඇමතිවරුන් 39 දෙනෙක් තනතුරුවලින් ඉවත් කල අතර භාරකාර කැබිනට්ටුව ඇමතිවරු 15කට සීමා විය යුතු බවට නියම කලා ය. එසේ කිරීමේ දී ඇය පෙන්නුම් කලේ “ජාතික අවශ්‍යතාවයට” නො ගැලපෙන්නේ යයි තමන් සලකන ඕනෑම තීන්දුවක් පාගා දැමීමට ඇගේ සූදානම යි.

පෙබරවාරි 7 දායින් සතියකට පසුව, ප්‍රථම වරට ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කල කුමාරතුංග ප්‍රකාශ කලේ ඇය කටයුතු කර ඇත්තේ උතුම් අරමුනු සහිතව බව

යි. බලය පැහැරගත් ඕනෑම ඒකාධිපතියෙකු මෙන් ඇය ද අවධාරනය කලේ දූෂිත හා ද්‍රෝහී ආන්ඩුව පෙරලා දැමීම හැරෙන්නට ඇයට වෙනත් විකල්පයක් නො තිබුන බව යි. මැතිවරනය අවසන් වූ පසුව ඇය සතු පුලුල් විධායක බලතල අත්හරිනවා පමනක් නො ව අහෝසි කරන බවට ද ජනාධිපති ශපථ කලා ය. 1994 දී බලයට පත්වීමට පූර්වයෙන්, 1978 දී දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) ආන්ඩුව පිහිට වූ, ඒකාධිපති, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට ඇය හා ඇගේ ශ්‍රීලනිපය පුනපුනා දුන් පොරොන්දු මෙන් ම, මෙය ද වැදගැන්මකට නැති පොරොන්දුවකි.

සිද්ධීන්ට දයාවිරහිත තර්කනයක් පවතියි. එල්ටීටීඊය සමග පැවති ඊනියා සාම ක්‍රියාවලිය පිලිබඳව දේශපාලන සංස්ථාපිතය තුල නො පැහිය හැකි ගැඹුරු විභේදනයන් පැවතුනි. ඒ සමග ම මුලින් කුමාරතුංග ආන්ඩුව හා, පසුව වික්‍රමසිංහ යටතේ, ක්‍රියාවට නැගුනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පැනවූ නිදහස් වෙලඳ පොල න්‍යාය පත්‍රයේ සමාජ බලපෑමට එරෙහිව විරෝධතා හා වැඩවර්ජන රැල්ලක් පැවතුනි. මෙම සමාජ හා දේශපලන ආතතීන් කොතෙක් උත්සන්නව පවතින්නේ ද යත් කුමාරතුංග වඩ වඩාත් ඉදිරියට තල්ලු කරනුයේ - අවසාන විග්‍රහයේ දී ඒකාධිපතියෙකු වන - රාජ්‍ය සංස්ථාපිතය හා මිලිටරිය මත රඳා පවතින බොනපාට්වාදියකු ලෙස ක්‍රියා කිරීමට ය.

ආන්ඩුව නෙරපා හැරීමට ගත් කුමාරතුංගගේ තීන්දුව, බලයෙන් පහවූවන් ද ඇතුලත් වන, පාලක කවයන් තුල බොහෝසෙයින්ම විරුද්ධත්වයක් පැන නැංවූයේ නැත. ජනාධිපතිගේ ක්‍රියාවන්ට පුහු විවේචන එල්ල කරන අතර වික්‍රමසිංහ හා ඔහුගේ ඇමතිවරු ආන්ඩුව නෙරපා හැරීමට නීතිමයව හෝ දේශපාලනිකව කිසිදු අභියෝගයක් එල්ල කිරීම ක්ෂනිකවම බැහැර කලහ. මහා ව්‍යාපාරිකයන් හා ජනමාධ්‍ය ද එයට ම අනුකූලත්වය දක්වති. මෙම එකඟතාවයෙන් ප්‍රකාශිත වන්නේ පාලක පන්ති කව තුල පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රනය වියැකී යෑම ගැනත් පාර්ලිමේන්තුවෙන් පිටස්තර ක්‍රමෝපායන්හි අවශ්‍යතාවය ගැනත් වර්ධනය වන පිලිගැනීම යි.

පාලක පන්තියේ ඉච්ඡාභංගත්වය පිලිබිඹු කරමින් විවිධ අටුවාකාරයෝ "ජාතිය බේරා ගැනීම" සඳහා බලසම්පන්න නායකයෙක් බලයට ගෙන ඒම ගැන ප්‍රසිද්ධියේ කතා කරති. දක්ෂිනාංශික *දි අයිලන්ඩ්* හා *දිවයින* පුවත් පත් කාලයක් තිස්සේ මෙම තේමාව වාදනය කරමින් සිටියි. මැතිවරනයකට එරෙහිව ද ජවිපෙ වැඩෙන බලපෑම ගැන ද අනතුරු අඟවමින් නොවැම්බර් 17 වැනි දින "අවශ්‍යව තිබේ. තුන්වැනි බලවේගයක්" යන මාතෘකාව යටතේ පල වූ කතුවැකිය, රටේ නායකත්වයක් නොමැතිකම ගැන වැලපෙමින් මෙසේ සමාප්ත කර තිබුනේ, "ජනාධිපති හා අගමැති යන දෙදෙනාම ඔවුන්ගේ හිත් හදාගෙන ක්‍රියාකල යුතු ය. නැතහොත් බලයේ තෝන්පට අත්හල යුතු යයි කියා සිටිය හැකි තුන්වැනි බලවේගයක්" සඳහා ආයාචනා කරමිනි.

කුමාරතුංග ආන්ඩුව නෙරපා හැරීමට දිනකට පසුව, කලමනාකරනය පිලිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය ගුනපාල නානායක්කාර සිය ව්‍යාපාරිකයන්ගේ රැස්වීමක් අමතා මෙම පනිවිඩයම වැල්වටාරන්වලින් තොරව ඉදිරිපත් කලේ මෙසේ ය. "මම දන්නා දේශපාලන ඉතිහාසය අනුව ඕනෑම රටකට තිබී ඇත්තේ එක් නායකත්වයක් පමනි. ජර්මනියේ සිටියේ එක් නායකයෙකි. ඒ හිට්ලර් ය. ඇමරිකාවට ඇත්තේත් එක් නායකයෙකි. ඒ ජෝර්ජ් ඩබ්. බුෂ් ය. තවත් බොහෝ රටවලට සිටියේ එක් නායකයෙකි. ඔවුන් නායකත්වය සම්පාදනය කල අතර එම නායකත්වය ඉතා පැහැදිලි විය."

කුමාරතුංගගේ මෑත පියවරයන් සම්බන්ධව ඇමරිකාවේ ප්‍රතිචාරය ඉතා සැරබාල එකක් වීම වැදගත්කමක් දරයි. පසුගිය නොවැම්බරයේ දී, වික්‍රමසිංහ වොෂින්ටන්හි සිටිය දී, ඇමරිකානු ජනාධිපති බුෂ් නිශ්චිතව හා ප්‍රසිද්ධියේ ම ඔහුට සහාය පලකලේ ය. තිරයෙන් පිටුපස දී ඇමරිකාව හා එහි හවුල්කරු ඉන්දියාව, ඒ අවස්ථාවේ දී, කුමාරතුංගට දැඩි ලෙස බලකලේ අඩිය පස්සට ගන්නා ලෙස යි. කෙසේ වුව ද එජාපෙ ආන්ඩුව බලයෙන් පහකිරීමෙන් පසුව ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ එවත් ප්‍රතිචාරයක් ඔවුන් දක්වා නැත. පසුගිය සතියේ දී ඇමරිකානු තානාපති කාර්යාලය "ශ්‍රී ලංකාවේ ජනතාව තෝරාගන්නා කවර ආන්ඩුවක් සමග වුව ද සමීපව වැඩ කරන බව" සඳහන් කෙටි ප්‍රකාශනයක් නිකුත් කලේ ය. මෙම හදිසි මාරුව බුෂ් පරිපාලනය සෑම ක්‍රමෝපායක් ම ඉවසා සිටීමට ලැහැස්ති බවට හා කොලඹ ඕනෑම පාලන තන්ත්‍රයකට, තමන්ගේ අවශ්‍යතාවන්ට සරිලන්නේ නම්, සහාය දීමට සූදානම්ව සිටින බවටත්, සලකුනකි.

වත්මන් අර්බුදය හමුවේ, කම්කරු පන්තිය අතීතයේ දී නායකත්වය සඳහා නෙත් යොමු කල, ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප), කොමියුනිස්ට් පක්ෂයේ (කොප) හා වෘත්තීය සමිතිවල පරිපූර්න බංකොලොත්කම හෙලිපෙහෙලි කරනු ලැබ තිබේ. එකදු සම්ප්‍රදායික කම්කරු සංවිධානයක් වත් කුමාරතුංගගේ ඒකාධිපති පියවරයන්ට එරෙහිව සැලකිය යුතු විරෝධතාවයක් හෝ පලකර නැත. ලසසප හා කොප නායකයෝ, ඔවුන් කලින් පලකල නිවට විරෝධතාවත් ඉක්මනින් ම අතහැර දමා, සිය සාමාජිකයන්ට මෙන්ම නායකයන්ටත් වෙඩි තබා ඝාතනය කල පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුන හා ශ්‍රීලනිපයේ සන්ධානයට ඒකාබද්ධ වූහ.

## මූලික විසංවාදයන්

ලංකාවේ දේශපාලන අර්බුදය පුද්ගලික හා ප්‍රතිවාදී පක්ෂ අතර සුලු ගැටුමක් ලෙසට සරලවම ලඝුකොට දැක්විය නො හැක. මීට වෙනස් ලෙස, එය, ලංකාවේ

ධනේශ්වරයේ ප්‍රාථමික යොමුවෙහි වේගවත් හා දුරදිග යන වෙනස්කම් ඇති කර ගැනීම සඳහා බලකෙරෙන, භූගෝලීය ආර්ථික හා දේශපාලන ක්‍රියාවලීන්ගේ විශේෂිත වූ තියුනු ප්‍රකාශනයකි. ප්‍රධාන දේශපාලන අස්ථායීකරන සාධකය වන්නේ, “ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ” මුවාවෙන් භූගෝලීය ආධිපත්‍යය සඳහා වේගවත් කල හා බෙහෙවින් පුලුල් කල ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ධාවනය යි.

ආක්‍රමනකාරී බුෂ් පරිපාලනයේ ප්‍රථම ඉලක්කය බවට, ඇෆ්ගනිස්ථානය පත්වීම අහම්බයක් නො වේ. එම රට, මැදපෙරදිග හා මධ්‍යම ආසියාවේ තෙල්වලින් පොහොසත් කලාපයට ආසන්නයේ ම පිහිටා ඇතුවා පමනක් නො ව, ඉන්දීය උපමහාද්වීපයේ කොටසක් ද වේ. මෙය පසුගිය දශකය පුරා, වොෂින්ටනය විසින්, දැවැන්ත ආර්ථික හා මූලෝපායික වැදගත්කමකින් සලකනු ලබන කලාපයකි. ඇමරිකානු සමාගම් රාශියක් ඉන්දියාවේ දොරට තඩිබාමින් සිටින්නේ එය සතු උගත් හා ලාභ ශ්‍රම තටාකයන්, දුරකථන මධ්‍යස්ථාන මෙහෙයුම්වල සිට මෘදුකාංග සංවර්ධනය හා විෂ්‍රාත්මක පර්යේෂන කටයුතු දක්වා වූ, සේවා සැපයුම් සඳහා යොදා ගැනීමට ය.

මෙම ප්‍රදේශය දශක ගනනාවක් තිස්සේ නො තකා හැරීමෙන් පසුව, විශේෂයෙන්ම දිගුකලක් තිස්සේ පවතින්නා වූ ශ්‍රී ලංකාවේ හා කාෂ්මීරයේ ගැටුම් වැනි අස්ථාවරකාරී සාධකයන් දුරුකල යුතු බවට ඇමරිකාව දැන් අවධාරනය කරයි. කොලඹට නො දැනී නොමැති මෙම පනිවිඩය, මෙරට ප්‍රමුඛ ව්‍යාපාරිකයන් විසින්, වසර ගනනාවක් තිස්සේ පවතින සිවිල් යුද්ධය අවසන් කල යුතු බවට කරන හඬ නැඟීමක් ලෙස මතු කර ඇත්තේ, රටේ ආර්ථිකයෙහි එකතැන පල්වීම හා අත්හැරීගිය අවස්ථාවන් පිලිබඳව වඩවඩාත් අසහනයට පත්වීමෙනි. ඇෆ්ගනිස්ථාන ආක්‍රමනයෙන් පසුභාගයේ දී, වියැකෙමින් තිබූ “සාම ක්‍රියාවලිය” පන ගැන්වීමට කුමාරතුංග අපොහොසත් බව සනාථ වීමෙන් පසුව, ඇගේ පාර්ලිමේන්තු බහුතරය පා යටින් කපාහැර, මහා මැතිවරනයක් පවත්වනු ලැබුනි. 2001 දෙසැම්බර් මාසයේ බලයට පත් වික්‍රමසිංහ ඉක්මනින් ම එල්ටීටීඊය සමග සටන් විරාමයක් ඇති කර ගත් අතර යුද්ධයට කල්පවත්නා විසඳුමක් සඳහා සාකච්ඡා ආරම්භ කලේ ය.

සාකච්ඡාවලට සම්බන්ධ සියලු පාර්ශ්වයන් හොඳින් දන්නා පරිදිම “සාම ක්‍රියාවලිය” කිසිවිටෙක සැබෑ සාමයක් සඳහා යොමු වූවක් නො ව කම්කරු පන්තිය සූරාකෑම සඳහා සහ දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීම සඳහා සිංහල දෙමල හා මුස්ලිම් ප්‍රභූව අතර බලය බෙදාගැනීමේ වැඩපිලිවෙලක් අරමුනු කරගත්තක් විය. එල්ටීටීඊය, එහි කොලඹ හවුල්කරුවන්ට වඩා, වැඩ කරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කරන හා ප්‍රජාතන්ත්‍රවාදයට කැප වූ සංවිධානයක් නො වේ. අන්තර්වාර පරිපාලනයක් සඳහා නොවැම්බර් 1 දින එය නිකුත් කල සැලසුම්, කොලඹ සමග හවුලේ තමන්ගේ ම ඒකාධිපති පාලනයක් උතුරු-නැගෙනහිර ඇටවීම සඳහා වූ කෙටුම්පතකට සමාන වූවකි.

කෙසේ වුව ද එල්ටීටීඊය සමග සාම ගිවිසුමක් සඳහා වූ තල්ලුව දකුනේ මුලුමහත් දේශපාලන සංස්ථාපිතය මත ම ගැඹුරු අස්ථායීකරන බලපෑමක් ජනිත කර ඇත. 1948 ලත් රූපික නිදහසේ පටන්ම ප්‍රධාන ධනපති පක්ෂ සියල්ලක්ම දෙමල විරෝධී ස්වෝත්තමවාදය මත රැඳී සිටිමින් කම්කරු පන්තිය බෙදා, විශේෂයෙන් ම පිටිසර ගම්මාන හා නගරවල තම ඡන්ද පදනම නිර්මානය කරගැනීමේලා, සිය මූලික දේශපාලන උපකරනය ලෙස එය යොදාගත්හ. 1956 වසරේ දී, කුමාරතුංග දැන් නායකත්වය දෙන ශ්‍රීලනිපය බලයට පත්වූයේ, විශේෂයෙන්ම සිංහල අන්තවාදීන්ගේ බලපෑමට නතුව, රාජ්‍ය භාෂාව වසයෙන් “සිංහල පමනක්” යන උග්‍ර වර්ගභේදවාදී ප්‍රතිපත්තිය මත පදනම් වෙමිනි.

කෙසේ වුව ද 1940 හා 50 ගනන්වල දී ධනේශ්වරය එහි බලගතු විරුද්ධවාදියෙකු වූ ලසසපට මුහුන දී සිටියේ ය. එවක දී, ට්‍රොට්ස්කිවාදය මත පදනම් වූ මෙම පක්ෂයට කම්කරු පන්තිය තුල ගැඹුරු මූලයන් පැවති අතර එය ධනවාදය කම්මුතු කිරීම සඳහා පන්ති පදනමක කම්කරුවන් එක්සත් කිරීමට සටන් වැදුනි. එහෙත් දේශපාලනිකව පසුපසට ලුහුටා යෑමේ දිගු කාලපරිච්ඡේදයකට පසුව, ලසසප, 1964 දී කුමාරතුංගගේ මෑනියන් වූ සිරිමා බන්ඩාරනායකගේ ශ්‍රීලනිප ආන්ඩුවට ඇතුලත් වූයේ ජාත්‍යන්තර සමාජවාදී මූලධර්මයන් මුලුමනින්ම පාවාදෙමිනි. සිංහල හා දෙමල කම්කරුවන් එක්සත් කිරීමේ අරගලය අත්හැර දමමින්, ශ්‍රීලනිපයේ සිංහල ස්වෝත්තමවාදය විවෘතව වැලඳගත් ලසසපයේ ක්‍රියාවන් කෙලින්ම තුඩුදුන්නේ වාර්ගික දේශපාලනයේ අනභියෝගී ආධිපත්‍යය උතුරේ දී බෙදුම්වාදී එල්ටීටීඊයේ හා දකුනේ දී ජවිපෙ නැඟීමට ය.

1970 ත් 77 අතර පැවති දෙවැනි බන්ඩාරනායක ආන්ඩුවේ කොටසක් ලෙසින් ලසසප ය දෙමල සුලුතරයට එරෙහිව ඍජු වෙනස්කම් කිරීමේ ප්‍රතිපත්ති වටයකටත් සිංහල එකම රාජ්‍ය භාෂාව බවට හා බුද්ධාගම රාජ්‍යාගම බවටත් පත්කල, ප්‍රජාතන්ත්‍ර විරෝධී වගන්ති අන්තර්ගත, නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමටත් ඍජුවම වගකිව යුතු ය.

දෙමල ධනේශ්වර දේශපාලනඥයන් නිශ්චිතව ඇඩි වගකීමක් දරන්නේ නමුදු යුද්ධය සඳහා මාවත පෑදුවේ බන්ඩාරනායක ආන්ඩුවේ හා පසුව පැමිනි ජේ.ආර්. ජයවර්ධනගේ එජාප පාලන තන්ත්‍රයේ පිලිවෙත් මගිනි. එහි විවෘත වෙලඳ පොල ප්‍රතිපත්තියට කම්කරු පන්තිය වෙතින් එල්ල වූ විරුද්ධත්වය මධ්‍යයේ එජාප ආන්ඩුව, 1983 දී, දෙමල විරෝධී ප්‍රචන්ඩත්වය සඳහා මැරයන් මුදාහල අතර එමගින් රට ආයුධ සන්නද්ධ ගැටුමකට ඇද දැම්මේ ය.

එජාප හා ශ්‍රීලනිපය යන දෙපාර්ශ්වය ම විසි වසරක්

තිස්සේ ගෙනගිය යුද්ධය හැට දහසකට අධික ජනයාගේ ජීවිත බිලිගත්තාක් මෙන් ම තවත් ලක්ෂ ගනනක් ආබාධිත හෝ නිවාස අහිමිවූවන් බවට පත් කලේ ය. එහෙත් කම්කරු පන්තිය වාර්ගික රේඛා ඔස්සේ බෙදීමේ මාධ්‍යයක් ලෙස මහා ව්‍යාපාරිකයන්ගේ සහාය ලත් යුද්ධය, ආර්ථිකය හිස් කල අතර නැගී එමින් තිබූ නිෂ්පාදනයේ භූගෝලීය ක්‍රියාවලීන්ගෙන් රට කොන් වී යාමට හේතුකාරක විය. කලාපය තුල භූගෝලීය ක්‍රියාවලියෙහි තිප්පොලක් ලෙසින් මෙරට පිහිටුවා ගැනීමට නම් යුද්ධය අවසන් විය යුතු බව කොලඹ මහා ව්‍යාපාරිකයන්ට දිදුලන ලෙසින් පැහැදිලි වූ කාරනයකි.

එහෙත් ආර්ථික තර්කනයෙන් අනකර ඇති දෙයත් පසුගිය අඩ සියවස පුරා දේශපාලන සංස්ථාපිතයේ සමස්ත ක්‍රියාපිලිවෙත් අතරත් පවත්නේ තියුනු ගැටුමකි. ශ්‍රී ලංකා රාජ්‍යයෙහි දෘෂ්ටිවාදී පදනම සකසා ඇති වාර්ගික දේශපාලනය, පැලපදියම් වූ බලගතු අවශ්‍යතා නිර්මානය කර තිබේ. එල්ටීටීඊය සමග සම්මුතියකට එලඹීමේ සෑම උත්සාහයක් ම, සිය වෘත්තීන්, සමාජ තත්වයන් හා ලාභ පොදි ගැසීම් යුද්ධය සමග ගැට ගසා ගෙන සිටි කොටස්වලත්, සමාජ ආතතීන් වාර්ගික රේඛා ඔස්සේ හරවා යැවීමට කැපවීගත් සියල්ලන්ගේත් වෛරය ස්වයංක්‍රීයව අවුලුවාලයි.

අප්‍රේල් 2 දින මැතිවරනය පරම වසයෙන්ම කිසිවක් නො විසඳන රැවටිල්ලකි. අතීතයේ දී එජාප හා ශ්‍රීලනිප ය අතර "තෝරාගැනීම" කට ඡන්දදායකයන් සතුව පැවතියා වූ ඉඩ පවා කුමාරතුංගගේ ක්‍රියාවන්ගෙන් අර්ථවිරහිත වී තිබේ. ඇය අතිශයින්ම පැහැදිලි කර ඇත්තේ, කුමන පක්ෂයක් හෝ පක්ෂ හවුලක් ජයග්‍රහනය කල ද, ඇයගේම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන සේ ඔවුන්ට බලකරන බව යි. එජාපෙ යලි පැමිනීම හෝ ජවිපෙ-ශ්‍රීලනිප ජයගැනීම යන දෙකින් කොයික සිදුවූවත් දේශපාලන අස්ථාවරත්වය තවදුරටත් වේගයෙන් එලඹෙනු ඇති අතර කුමාරතුංග බලයේ තෝන්පට කෙලින්ම සියතට ගැනීම කරා මෙහෙයවෙනු ඇත.

## දේශපාලන අන්තරායන්

මේ තත්වයේ දී කම්කරු පන්තිය දැවැන්ත දේශපාලන අන්තරායන්ට මුහුන දී සිටී. වැඩ කරන ජනතාව යුක්ති යුක්ත ලෙසින්ම එජාපෙ ආන්ඩුවට හා එහි පිලිවෙත්වලට සතුරු ය. වික්‍රමසිංහගේ එජාපෙ, 2001 මැතිවරනය ජයගත්තේ, සාමය හා සෞභාග්‍යය පොරොන්දු වෙමින් වුව ද ක්‍රියාවට නැගුවේ කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා තරුනයන්ගේ පුලුල් ස්ථරයන් පීඩාවට පත්කල ම්ලෙච්ඡ ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලකි. ධනවතුන් හා දුගීන් අතර පරතරය පලල්වීමට පටන්ගත්තේ ය. ආන්ඩුවේම "යලි පුබුදමු ශ්‍රී ලංකා" ලියවිල්ල අනුව පවුල් සංඛ්‍යාවෙන් සියයට 45ක් යැපෙන්නේ දිනකට ඩොලර් 2කට අඩු මුදලකින් බවට ඇස්තමේන්තු කර තිබේ.

එහෙත්, කුමාරතුංග ආන්ඩුව ඉවත් කල ක්‍රමය පිලිබඳව කම්කරුවන්ට උපේක්ෂා සහගත විය නො හැක. බලය ගැනීම සඳහා තමන්ගේම ස්වාධීන ක්‍රියාමාර්ගයකින් තොර වූ විට කම්කරු පන්තිය සතුරු පන්ති බලවේගයන්ගේ ගොදුරක් බවට පත්වේ. වික්‍රමසිංහගේ ආන්ඩුව කෙරෙහි පැතිර පැවති විරුද්ධත්වය, ඍජු ඒකාධිපති පාලනයකට යොදා ගැනෙන සියලු යාන්ත්‍රනයන් සැකසීම සඳහා, කුමාරතුංග, ගසාකෑවා ය. ඇය ක්‍රමානුකූලව රාජ්‍ය තන්ත්‍රය මත සිය ග්‍රහනය දැඩි කලා ය. ඇගේ විශ්වාසවන්තයින් මිලිටරියේ, පොලිසියේ හා අධිකරනයේ ඉහල තනතුරුවලට පත්කරමින් හෝ ඒවායේ රඳවා තබාගනිමින්, ඒ සමගම, කම්කරු පන්තියට එරෙහිව මුල්ගැලවී ගිය සුලු ධනපති බලවේගයන් මෙහෙය විය හැකි මාධ්‍යයක් ලෙසින් ජවිපෙ සන්ධානයකට කැඳවාගත්තා ය.

පැතිර පවත්නා අතෘප්තිය ආකර්ෂනය කරගත්තා වූ ද විදුලි සැරයක් ලෙස යොදාගත හැක්කා වූ ද බලවේගයක් වසයෙන්, ජවිපෙ යලි පෙලගස්වා ගැනීමට පාලක පන්ති ප්‍රභූව දැඩි වෙහෙසක් දරා ඇත. එහෙත් ජවිපෙ කෙරෙහි විශ්වාසය තබන්නවුන් තමන් විසින් ම තම ගෙලට දමා ගන්නේ මර තොන්ඩුවක් බවට, සමාජවාදී සමානතා පක්ෂය, කෙලින්ම අනතුරු අඟවා සිටියි. එහි සියලු පොරොන්දු හා අතීත සමාජවාදී පුරසාරම් තිබියදීම, ජවිපෙට සාමාන්‍ය වැඩකරන ජනතාවගේ මූලික අවශ්‍යතාවන්, නිශ්චිතවම ඔවුන් ආරක්ෂා කිරීමට කැපවී සිටින ධනේශ්වර ක්‍රමය සමග එකිනෙකට නොගැලපෙන තතු තුල, සාක්ෂාත් කල නො හැකි ය. ඔවුන් විසින්ම උසිගන්වනු ලබන මහජන ප්‍රාර්ථනාවන් හා බලාපොරොත්තු ඉටු කල නො හැකි තත්වයේ දී ජවිපෙ, නො වැලැක්විය හැකි ලෙසින් ම, වැඩ කරන ජනතාව වෙතට හැරෙනු ඇත්තේ, වඩා වැදගත් ජාතියේ අවශ්‍යතාවන් වෙනුවෙන්, මහජන අවශ්‍යතා කැප කල යුතු බවට බලකරමිනි.

ඔවුන්ට හරස් කපන ඕනෑම අයෙකු සම්බන්ධයෙන් ජවිපෙ 1980 ගනන් අවසාන කාලයේ දී, සිවිල් යුද්ධය අවසන් කිරීමට දැරුනු ප්‍රථම අසාර්ථක උත්සාහය වූ ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව ගෙනගිය මිනීමරු ව්‍යාපාරයේ දී මෙන්, තිරශ්චීන ක්‍රමයකට ක්‍රියාකරනු ඇත. එවක දී, කම්කරුවන්, වෘත්තීය සමිති හා පක්ෂ නායකයන් සිය ගනනක්, තමන්ගේ ස්වෝත්තමවාදී ව්‍යාපාරයට සහාය නො දැක්වීමේ කරුන මත, ජවිපෙ ප්‍රහාරකයන් විසින් අමුඅමුවේ ඝාතනය කරන ලදහ. ජවිපෙ මිනීමරු සේවාව කම්කරු පන්තිය ත්‍රස්ත කිරීමේ තම කර්තව්‍යය සඳහා ලබා ගෙන අවසන්වීමෙන් පසුව, එජාප ආන්ඩුව, එහි නායකයන් මරාදමමින් වේගයෙන් එම පක්ෂය මත කඩාපැන්නේ ය. රාජ්‍ය ආරක්ෂක හමුදාවන් යොදවාගෙන දකුනේ භීෂනය මුදාහල අතර එහි දී ලක්ෂයකට අධික ගම්බද තරුනයන් ඝාතනය කල බවට ගනන් බලා ඇත. පාලක පන්තියේ මෙම ඝාතන ව්‍යාපාරය සමාජ

අසහනයේ සෑම සේයාවක්ම පිටුදැකීමේ ප්‍රයත්නයක් විය.

කුමාරතුංග 1994 දී ජනාධිපති තනතුර ජයගැනීමෙන් පසුව යලි වතාවක් ජවිපෙ නීතිගත තත්වයට පත් කෙරුනි. පසුගිය දශකය පුරාම ජවිපෙ නායකයන්, ලොකු ව්‍යාපාරිකයන්ගේ ආශිර්වාදය මධ්‍යයේ, නිල දේශපාලනයෙහි නීතියුක්ත කොටසක් ලෙසට හුවා දැක්වීමට මාධ්‍ය මගින් මහත් වෙහෙසක් දරන ලදි. පක්ෂය එහි පුල්ලි වෙනස් කර ඇතැයි යන මාරක මිත්‍යාව පෝෂනය කිරීම සඳහා සෑම උත්සාහයක්ම දරා තිබේ. කෙසේ වුව ද ජවිපෙ 1980 ගනන්වල පැවති ආකාරයට ම පවතින අතර එය පසුගිය වසරේ ගොඩනැගූ දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය, ඉහලින්ම අස්ථායී ෆැසිස්ට්වාදී රූපාකාරයකින් යුත් අනෙකුත් සිංහල අන්තවාදීන් ද කුමන මාධ්‍යයකින් හෝ “රට බේරාගැනීමේ” අධිෂ්ඨානයෙන් යුත් බෞද්ධ ධුරාවලියේ අතිශයින්ම ප්‍රතිගාමී අංශ ද කැටිකොට ගත් එකකි.

ධනේශ්වරයේ එකදු ප්‍රතිවාදී කල්ලියකට වත්, වැඩ කරන ජනතාවගේ අතිමහත් බහුතරය මුහුන පා සිටින දැවෙන ප්‍රශ්න වන සාමය, හොඳ ජීවන මට්ටම් හා ප්‍රජාතන්ත්‍රීය අවශ්‍යතාවන් යන කිසිවකටත් කිසිදු විසඳුමක් ඇත්තේ නැත. ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන් රට සිවිල් යුද්ධයකට ඇද දැමුවා වූ භේදකාරී වාර්ගික දේශපාලනය වෙත නිරතුරුවම යොමු වී සිටින්නේ එබැවින් ය. සිය ප්‍රතිපත්තීන් තුලින් ම නිර්මානය කලා වූ පරස්පරවිරෝධයන් විසඳීමෙහි ලා තරයේ ම අසමත්ව සිටින පාලක පන්තිය, දැන්, සියල්ලට ම ඉහලින් වැඩ කරන ජනතාවට එරෙහිව එල්ල කෙරෙන විවෘත ඒකාධිපති ක්‍රමවේදයන් මගින්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ සම්මතයන් මුලුමනින්ම ඉවත දැමීම කරා ගමන් ගනිමින් සිටී.

වත්මන් දේශපාලන හා සමාජ අර්බුදය ප්‍රගතිශීලී පදනමක විසඳීමට සමත් එකම සමාජ බලවේගය කම්කරු පන්තිය යි. එනමුදු එය සාක්ෂාත් කල හැක්කේ, කම්කරු පන්තිය, ධනේශ්වරයේ සියලු කොටස් වෙතින් සිය දේශපාලන ස්වාධීනත්වය පිහිටුවා ගැනීම මගින් සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ගම්බද හා නාගරික ජනතාවන් එය පිටුපස පෙලගස්වා ගනිමින්, වරප්‍රසාදිත සුලු කොටසකගේ ලාභය සඳහා නො ව බහුතරයකගේ අවශ්‍යතාවන් හා ප්‍රාර්ථනාවන් ඉටු කල හැකි ආකාරයකට සමාජය යලි සංවිධානය කිරීමෙන් පමනකි.

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය, සිය ජාත්‍යන්තර මාධ්‍යය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හරහා ඉදිරිපත් කරන ක්‍රියාමාර්ගය එය යි. සසප හා එහි පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය සියලු වර්ගවල ස්වෝත්තමවාදයට එරෙහිවත්, සිංහල, දෙමල හා මුස්ලිම් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමටත්, ව්‍යසනකාරී සිවිල් යුද්ධයට එරෙහිවත්, මූලධර්මාත්මක හා අධිෂ්ඨාන සහගත ආස්ථානයක අඛන්ඩව පෙනී සිටි එකම පක්ෂය යි.

සියලු වර්ගවල වර්ගවාදය හා ජාතිවාදය ප්‍රතික්ෂේප කරන ලෙස සෑම කම්කරුවෙකුගෙන්ම සසප ඉල්ලා සිටී. සියල්ලන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සම්මුති විරහිතව ආරක්ෂා කරමින් තමාගේම ස්වාධීන දේශපාලන ක්‍රියාමාර්ගය විස්තාරනය කිරීම මගින්, කම්කරු පන්තිය, ලංකාවේ පමනක් නො ව කලාපය පුරාම පීඩිතයන් බලගතු ලෙස ආකර්ශනය කර ගනු නිසැක ය. එමගින් ඉන්දියානු උපමහාද්වීපය පුරා ද ජාත්‍යන්තරව ද, සමාජවාදී පරිවර්තනයක කොටසක් ලෙස, ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් පිහිටුවීමේ පදනම සකස් කෙරෙනු ඇත.

**සමාජවාදී සමානතා පක්ෂය**

තැ.පෙ. 1270, කොලඹ.
දුරකථනය: 2712104
ඊ-මේල්: wswscmb@sltnet.lk

**සමාජවාදී සමානතා පක්ෂය 2004 මහ මැතිවරනයේදී කොලඹ දිස්ත්‍රික්කයෙන් කතුර ලකුනින් තරඟ වදී**


© www.wsws.org